# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/219/2025 (PSC)
AAT/221/2025 (PSC)

01. එස්.එන් වීරසිංහ,
02. පී.එම්.ටී.ජේ.සෝමරත්න,
03. පී.එස්.වලවේගේ,
04. එන්.ඒ.සී.ජේ.කුමාර,
05. බී.ඒ.එන්.පෙරේරා.
06. ජේ.පී.එම්.පී.ප්‍රනාන්දු,
07. කේ.ඒ.ඒ.දිනූෂ,
08. එල්.ආර්.ඩී.ද සිල්වා,
09. වයි.එම්.එස්.කොඩිකාර

**අභියාචකවරුන්**

**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය :-2026.04.08**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :-

1. අභියාචක එස්.එන්.වීරසිංහ ඇතුළු 09 දෙනා,
2. ශ්‍රී ලංකා නිදහස් තැපැල් සංගමයේ සභාපති/ලේකම්,
3. පාර්ශවකරුවන් පී.එම්.ටී.ජේ.සෝමරත්න ඇතුළු 10 දෙනෙකු,
4. පී.බී.විජේසිංහ පාර්ශවකරුවෙකි.

අභියාචකවරුන් වෙනුවෙන් නීතිඥ හරිගුප්ත රෝහණධීර මහතා සමග නීතිඥ එසන්ති මෙන්ඩිස් මිය.

වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ගයාත්‍රි කෝසලා මිය.

## -<u>නියෝගය</u>-

## ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය

අභියාචකවරුන් සියළු දෙනා තැපැල් දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ හා/හෝ III ශ්‍රේණියේ තැපැල් සේවා නිලධාරීන් වේ. අභියාචකවරුන්ගේ ගැටළුව වන්නේ, තැපැල් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III

ශ්‍රේණියේ තැපැල් අධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2024(2025) බඳවා ගැනීම් සම්බන්ධව සුදුසුකම් ප්‍රසිද්ධ කිරීමේ නිවේදනයට එදිරිවය. අභියාචකවරුන් තමාගේ ගැටළුව පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත 2025.04.12, 2024.09.12 දින එස්.එන්.වීරසිංහ ඇතුළු පිරිස 40, 2024.10.03 නිදහස් තැපැල් සේවා සංගමයේ සභාපති/ලේකම් ඉල්ලීම් කර ඇති අතර, අදාළ ඉල්ලීම් තැපැල් අමාත්‍යාංශයේ ලේකම් මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2025.04.12 දින ලිපියක් මඟින් ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත දන්වා ඇත්තේ, අදාළ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බවයි. එහි පිටපත් තැපැල්පතිට යවා ඇත. අදාළ තීරණයෙන් තෘප්තිමත් නොවූ අභියාචකයින් 2025.09.04 දින, AAT/219/2025/PSC ඉල්ලීම මෙම අධිකාරයට එවා ඇත. 2025.11.10 දින පී.එම්.ටී.ජේ.සෝමරත්න ඇතුළු 10 දෙනෙකුද ඊට පාර්ශවකරුවන් වී ඇත. අදාළ අභියාචනය තුළින් අභියාචකයින් ඉල්ලා සිටින්නේ,

03. මේ අතර, ඉහත කී "**තැපැල් සේවා නිලධාරී බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය**" 2012.06.21 දින අනුමත වීමෙන් පසු දෙපාර්තමේන්තුවට පත්වීම් ලද කණ්ඩායමක් (2013 හා 2014 වර්ෂවල) හා ඔවුන් විසින් පිහිටුවා ගන්නා ලද "**ශ්‍රී ලංකා නිදහස් තැපැල් වෘත්තියවේදීන්ගේ සංගමය**" නැමැති වෘත්තීය සමිතියක් විසින් මෙකී තැපැල් අධිකාරී තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමේ දී ඔවුන්ට ඒ සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස තැපැල් පරිපාලනයෙන් හා රාජ්‍ය සේවා කොමිෂම් සභාවෙන් ඉල්ලීම් කර ඇති බව දැනගත් මෙම අභියාචක ඇතුළු තිදෙනෙකු විසින් දැනට අනුමත ව පවත්නා නීති රීති හා පරිපාටි යටතේ මෙකී කණ්ඩායමට සුදුසුකම් නොමැති බවත්, එම නිසා සුදුසුකම් සපුරා නොමැති කණ්ඩායමකට විභාගය සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දීම, සුදුසුකම් සපුරා ඇති අභියාචකගේ අයිතිවාසිකම් උල්ලංඝනයකට හේතු වන හෙයින්, එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂම් සභාවෙන් ඉල්ලා සිටින ලදි.

එකී ඩබ්ලිව්.කේ.ඩී.එස්.රාජපක්ෂ හා ආර්.එම්.යූ.පී.එන්.සී.කේ.රත්නායක යන අයගේ 2024.08.29 දිනැති ඉල්ලීම් ලිපියේ සත්‍ය ඡායා පිටපතක් අ-2 ලෙස ලකුණු කර ඇති අතර, මෙම අභියාචනයේ කොටසක් ලෙස පිළිගන්නා ලෙස අයදිමින් ඉදිරිපත් කර සිටී.

04. මෙකී අ-2 ලෙස ලකුණු කරන ලද එකී ඉල්ලීම අනුව ඉහත කී සුදුසුකම් සපුරා නොමැති කණ්ඩායමේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට රාජ්‍ය සේවා කොමිෂම් සභාව තීරණය කරන ලද බව රාජ්‍ය සේවා කොමිසම් සභා කාර්යාලයේ 2025.04.22 දිනැති ලිපියෙන් හා තැපැල් දෙපාර්තමේන්තුවෙහි 2025.05.29 දිනැති ලිපියෙන් දැනුම්පත් කරන ලදි.

එකී තීරණය මෙම අභියාචක වෙත දැනුම් දීමේ ලිපිවල සත්‍ය ජායා පිටපතක් පිළිවෙළින් අ-3-1 හා අ-3-2 ලෙස ලකුණු කර ඇති අතර, මෙම අභියාචනයේ කොටසක් ලෙස පිළිගන්නා ලෙස අයදිමින් ඉදිරිපත් කර සිටී.

26. ඉහත සියළු කරුණු අනුව ප්‍රකාශ කර සිටින්නේ,

1. හුදු පුද්ගල අවශ්‍යතාවයන් මත විවිධ වැරදි කරුණු වංචනිකව ඉදිරිපත් කර, පවත්නා නීතියට අවනත නොවන ක්‍රියාවන් සිදුකරන නිලධාරීන් සහ/හෝ ඒ සඳහා ආධාර සහ/හෝ අනුබල දෙන යම් නිලධාරීන් වෙතොත්, ඔවුන් සම්බන්ධයෙන් සහ/හෝ නොදරන තනතුරක් භාවිත කරන නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග සහ/හෝ නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බවත්,

II. එමෙන්ම අභියාචනා කිරීමේ අයිතිය නීතිය මඟින් ව්‍යවස්ථාපිත වී ඇතත්, එකී අයිතිය යටතේ කොමිසමේ නීත්‍යානුකූල තීරණ සම්බන්ධයෙන් කරුණු වැරදි හා වංචනික ලෙස ඉදිරිපත් කර, මෙවැනි අභියාචනා ඉදිරිපත් කිරීමෙන් මෙම අභියාචක සහ/හෝ වෙනත් පාර්ශවයන්ට සිදුවන බලවත් අගතිය සම්බන්ධයෙන් අත්තනෝමතික ව අභියාචනා ඉදිරිපත් කරනු ලබන පුද්ගලයින් සහ/හෝ කණ්ඩායම් වගකීමට ලක් කළ යුතු බවත්,

III. එබැවින් මේ වන විට සුදුසුකම් සම්පූර්ණ කර ඇති සහකාර තැපැල් අධිකාරීවරුන්ගේ, වසර 3ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සහිත I ශ්‍රේණියේ තැපැල් සේවා නිලධාරීන්ගේ හා පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සහිත වසර 13ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සහිත II ශ්‍රේණියේ තැපැල් සේවා නිලධාරීන්ගේ (මොවුන්ගේ සමස්ත තැපැල් සේවා නිලධාරී සේවාකාලය වසර 16 ඉක්මවා ඇත) නෛතික

අපේක්ෂාව බිඳ වැටීමකට ලක් නොවිය යුතු බව සහ ඔවුන්ට උසස් වීමට ඇති අවසාන අවස්ථාව ද මෙය විය හැකි බැවින් ඔවුන් අගතියට පත් නොවිය යුතු බවත් ය.

මෙම කරුණු පිළිබඳව අභියාචකවරු සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව යන දෙපාර්ශවයම මෙම අධිකාරයට ලිඛිතව සහ වාචිකව අදහස් ඉදිරිපත් කරන ලදි. එසේම අමතර පාර්ශවකරුවන් විසින් ද ලිඛිත දේශන සහ වාචිකව කරුණු ඉදිරිපත් කරන ලදි.

මෙම අභියාචනය විමසීමට යන අතරතුරදී AAT/221/2025/PSC යටතේ කර තිබූ ඉල්ලීම මෙම කරුණට සබැදි නිසාත්, අදාළ පුද්ගලයාද මෙහි ඉල්ලුම්කරුවන් වන නිසාත්, මෙම ඉල්ලීමට සම්බන්ධ වීමට ඉඩ සළසා ගනිමින් AAT/221/2025/PSC ඉල්ලීම ඉල්ලා අස්කර ගැනීමට අවසර ඉල්ලා සිටින ලදි. ඒ පිළිබඳව සළකා බැලූ අධිකාරිය ඔවුන්ගේ අයිතිවාසිකම් මෙම අභියාචනය මගින් ලබා ගැනීමට යටත්ව අදාළ ඉල්ලීම අස්කර ගැනීමට **2026.02.03** දින අවසර ලබා දී ඇත.

මෙම අභියාචකවරුන්ගේ ප්‍රධාන ඉල්ලීම වන්නේ, මෙම අයට අදාළව ප්‍රසිද්ධ කරන ලද දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා නැති බැවින්, විභාගයට ඉදිරිපත් වීමට අවස්ථාව සළසා දෙන ලෙසය. අදාළ දැන්වීම අනුව මෙම විභාගය සඳහා අයදුම්කරුවන්ට මූලික සුදුසුකම් වන්නේ (4 ජේදය යටතේ)

4 බඳවා ගැනීමේ සුදුසුකම් :-

I. පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සහිත තැපැල් සේවා නිලධාරී II ශ්‍රේණියට උසස් වී වසර තුනක (03) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයෙකු වීම.

හෝ

II. තැපැල් සේවා නිලධාරී I ශ්‍රේණියට උසස් වී වසර තුනක (03) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයෙකු වීම.

හෝ

III. සහකාර තැපැල් අධිකාරී තනතුර දරණ නිලධාරියකු වීම.

**08. 8.1** ලිඛිත විභාගයः

**8.1.1** මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

8.1.2 ලිඛිත විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විතය.

| | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | කාලය |
|---|---|---|---|---|
| 1 | සාමාන්‍ය පරිපාලනය | 100 | 40% | පැය 03 |
| 2. | මුදල් රෙගුලාසි | 100 | 40% | පැය 03 |
| 3. | විෂයානුබද්ධ අධ්‍යයනය | 100 | 40% | පැය 02 |

8.2 සම්මුඛ පරීක්ෂණය.

8.2.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ශ්‍රී ලංකා තැපැල් කාර්යාල චක්‍රලේඛයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා පමණි. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

අභියාචකවරුන් ප්‍රකාශ කරන්නේ මෙහි i යටතේ සඳහන් II ශ්‍රේණියට උසස්වී වසර 03 ක සේවා කාලය යන්න සංශෝධනය විය යුතු බවය. ඒ සඳහා හේතු සාධක ලෙස පෙන්වා දෙන්නේ,

- ➢ අමාත්‍ය මණ්ඩල තීරණය,
- ➢ වැටුප් සහ සේවක සංස්ථා තීරණය,
- ➢ රාජ්‍ය පරිපාලන නියෝග අනුව

1. නවසේවා ව්‍යවස්ථාවක් සැකසීමට දැනට කටයුතු කරගෙන යන බැවින් සහ ඒ කටයුතු ප්‍රමාද වීම තමාගේ පාලනයෙන් තොර වූවක් වන නිසාත්,
2. දැනටමත් අදාළ පිරිස් මෙම වැටුප් තලයේ වැටුප් පරිමානයෙන් වැටුප් ලබමින් සිටින බවත්,
3. පරණ සේවා ව්‍යවස්ථාව අනුව III ශ්‍රේණියේ නිලධරයන් වසර 10 සැපිරූ පසුව සහ අනික් සුදුසුකම් සපුරා ඇත්නම් II ශ්‍රේණියට පත්විය යුතු බව,
4. අභියාචකරුවන් දැනටමත් වසර 13 වැඩි සේවා කාලයක් සපුරා ඇති බවත්,
5. මේ නිසා වැඩි පිරිසකට විභාගයට මුහුණ දීමට අවස්ථාව සැළසෙන බැවින්, ඉතා දක්ෂ හා හොඳ පිරිසක් තොරා ගැනීමට වැඩි ඉඩ ප්‍රස්ථා සැලසෙන බවත් ය.

අදාළ කරුණු කෙරේ ගැඹුරින් අවධානය යොමු කළ මෙම අධිකාරය, **2025.09.30** දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව දන්වා සිටින්නේ වසර **13** සේවා කාලයක් සපුරා ඇති අයටත් විභාගයන්ට ඉදිරිපත් වීම සඳහා අවස්ථාව සළසා දීම සුදුසු බවත්, ඒ පිළිබඳව සළකා බලන ලෙසය. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව **2026.01.16** දින ලිපිය මගින් මෙම අධිකාරයට දන්වා සිටින්නේ,

**නිරීක්ෂණ :**

i. AAT/219/2025 සහ AAT/221/2025 යන අභියාචනයන්ට අදාළ අභියාචකයින් තැපැල් සේවා නිලධාරී බඳවා ගැනීමේ පටිපාටිය යටතේ II ශ්‍රේණියට උසස්ව නොමැති බැවින් ඔවුන් හට විධායක (SL I) තනතුර සඳහා වන මෙම සීමිත තරඟ විභාගයට මුහුණ දීමට හැකියාවක් නොමැති බව.

ii. ඔවුන් දැනට යෝජිත සේවා ව්‍යවස්ථාවට අදාළ නව වැටුප් ලබන නමුත් II ශ්‍රේණියේ නිලධාරීන් ලෙස සැලකීමේ හැකියාවක් නොමැති බව.

iii. අමාත්‍ය මණ්ඩලය විසින් නව වැටුප් පරිමාණ අනුමත කර ඇත්තේ යෝජිත නව සේවා ව්‍යවස්ථාවන් හා බැඳිව බව හා එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මේ බවන විට එම නව වැටුප් පරිමාණ යටතේ වැටුප් ලබන නිලධාරීන් ඉදිරියේ දී අනුමත වීමට අපේක්ෂිත නව සේවා ව්‍යවස්ථාව වෙත අන්තර්ග්‍රහණය වීමට නියමිත බව.

**තීරණ :**

**1.** කෙසේ වෙතත් විධායක සේවා ගණය සඳහා බඳවා ගැනීම යටතේ අවශ්‍ය වන අවම පළපුරුද්ද වන්නේ, පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සහිත තැපැල් සේවා නිලධාරී II ශ්‍රේණියට උසස් වී වසර **03** ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම වන බැවින් ද, තැපැල් සේවා නිලධාරී II ශ්‍රේණියට උසස්වීම සඳහා III ශ්‍රේණියේ වසර **10**ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ යුතු බැවින් ද, II ශ්‍රේණියේ උසස්වීම් මෙතෙක් ක්‍රියාත්මක නොවන බැවින් ද, අනෙකුත් සියළු අවශ්‍යතා සම්පූර්ණ කරනුයේ නම්, සේවය ස්ථිර කරන ලද III ශ්‍රේණියේ වසර **13**ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද තැපැල් සේවා නිලධාරීන් සඳහා පහත කොන්දේසි වලට

යටත්ව විධායක සේවා ගණය සඳහා වන සීමිත තරඟ විභාගයට අයදුම් කිරීමට අවස්ථාව සලසා දීම.

කොන්දේසි :

1. ඉහත සඳහන් නිලධාරී කණ්ඩායමට අයදුම් කිරීමට හැකි වන පරිදි නිවේදනය නැවත පළ කළ යුතුය.
2. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දිනය පළකර ඇති නිවේදනයේ සඳහන් දිනයම ලෙස සැලකිය යුතු ය.
3. පළකරන ලද නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් හට නැවතත් නව අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.

මෙම තීරණ එසේ ක්‍රියාත්මක වෙමින් පවතින අතරතුර මෙම අධිකාරයට මෙම අභියාචනාවන් සම්බන්ධව පාර්ශවකරුවෙකු ලෙස පැමිණි ජී.බී.විජේසිංහ මහතා සැළකර සිටින්නේ,

එසේ හෙයින් මැදිහත් වීමට අපේක්ෂිත මෙම අභියාචක ගරු විනිශ්චය සභාවෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ,

අ. මැදිහත් වීමට අපේක්ෂිත මෙම අභියාචක අංක AAT/219/2025(PSC) දරණ මෙකී අභියාචනයේ බලපෑමට ලක්වන පාර්ශවකරුවෙකු ලෙස හෝ බලපෑමට ලක්වන වගඋත්තරකරුවෙකු ලෙස ඇතුළත් කරන ලෙසත්,

ආ. AAT/219/2025(PSC) දරණ අභියාචනයේ අභියාචක වගඋත්තරකරුවන් සහ විත්තිකාර වගඋත්තරකරුට මෙම ඉල්ලීම සම්බන්ධයෙන් නොතීසි නිකුත් කරන ලෙසත්,

ඇ. මෙම ඉල්ලීමේ සඳහන් මූලික විරෝධතාවය පිළිගන්නා ලෙසත්, එම විරෝධතා කරුණු මත අංක AAT/219/2025(PSC) දරණ මෙකී අභියාචනය වැඩිදුර විභාගයට නොගෙනම නිශ්ප්‍රභ සහ/හෝ ප්‍රතික්ෂේප කරන ලෙසත්,

ඈ. මෙම ඉල්ලීමේ සඳහන් කරුණු මත AAT/219/2025(PSC) දරණ අභියාචනය මුල පටන්ම බල ශූන්‍ය සහ/හෝ බලරහිත තත්ත්වයේ පවතින බව (Null and void) තීරණය කර, මෙකී අභියාචනය නිශ්ප්‍රභ සහ/හෝ ප්‍රතික්ෂේප කරන ලෙසත්,

ඉ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදෙන ලද **2025.04.22** දිනැති තීරණය සහ/හෝ **2025.08.06** දිනැති

විභාගය පැවැත්වීමේ දැන්වීම පිළිගන්නා ලෙසත්, ඒ අනුව කටයුතු කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත සහ/හෝ රාජ්‍ය සේවා කොමිෂම් සභාව මගින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සහ/හෝ තැපැල්පති වෙතත් නියම කරන ලෙසත්,

ඊ. අයදුම්පත් කැඳවා ඇති තැපැල් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියේ තැපැල් අධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - **2024 (2025)** නැවත අයදුම්පත් කැඳවීමකින් තොරව සහ/හෝ විභාග දැන්වීමේ දැනට නියම කර ඇති විභාගයට සුදුසුකම් සම්පූර්ණ කිරීමේ දිනය කිසිදු ලෙසකින් වෙනස් කිරීමකින් තොරව විභාගයේ ඉදිරි කටයුතු කඩිනමින් සිදුකරන ලෙස රාජ්‍ය සේවා කොමිෂම් සභාව සහ/හෝ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සහ/හෝ තැපැල්පති වෙත නියම කරන ලෙසත්,

උ. **2025.10.23** දිනැති අංක PSC/APP/19/8/20/**2025** දරණ ලිපිය හා එමගින් තහවුරු කර ඇති රාජ්‍ය සේවා කොමිෂම් සභාවේ නියෝගය බලරහිත සහ/හෝ ප්‍රතික්ෂේප සහ/හෝ නිශ්ප්‍රභ කරන ලෙසත්,

නැතහොත්,

**2025.10.23** දිනැති අංක PSC/APP/19/8/20/**2025** දරණ ලිපිය හා එමගින් තහවුරු කර ඇති රාජ්‍ය සේවා කොමිෂම් සභාවේ නියෝගය මුල පටන්ම බලශූන්‍ය සහ/හෝ බලරහිත තත්ත්වයේ පවතින නියෝගයක් (Null and void) තීරණය කරන ලෙසත්,

ඌ. විවිධ වැරදි කරුණු වංචනිකව ඉදිරිපත් කර, පවත්නා නීතියට අවනත නොවන ක්‍රියාවන් සිදු කරන නිලධාරීන් සහ/හෝ ඒ සඳහා ආධාර සහ/හෝ අනුබල දෙන යම් නිලධාරීන් වෙතොත්, ඔවුන් සම්බන්ධයෙන් සහ/හෝ ,නොදරන තනතුරක් භාවිතා කරන, නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග සහ/හෝ නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ බලධාරීන් වෙත නියෝග කරන ලෙසත්,

එ. නඩු ගාස්තු සහ

ඒ. විනිශ්චය අධිකාරයට මැනවැයි හැඟෙන වෙනත් සහ වැඩිමනත් සහනයන් ද වේ.

මෙම සියළු කරුණු වලට අමතරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් **2026.04.07** දින මෙම අධිකාරයට ලිපියක් මගින් දන්වා සිටින්නේ,

1. මෙම අභියාචනයේ දී නිලධාරීන් විසින් සඳහන් කර ඇත්තේ, ඒ වන විට කැඳවා තිබූ විභාගය සඳහා ශ්‍රේණි ගැටලුවක් හේතුවෙන් ඔවුන් හට පෙනී සිටීමේ අවස්ථාව ලැබී නොමැති බවයි.
2. එසේ නම් ඒ වෙනුවට රාජ්‍ය සේවා කොමිෂම් සභාව විසින් ලබා දී ඇති විසඳුම වන, II ශ්‍රේණියට උසස් වී වසර **03**ක් ගතවීම වෙනුවට III ශ්‍රේණියේ වසර **13**ක සක්‍රිය හා සතුටුදායක කාලය සැලකීම මගින් ශ්‍රේණි පිළිබඳ ගැටලුවට විසඳුමක් ලබා දී ඇත.
3. ඉන් අනතුරුවද සෑහීමට පත් නොවන්නේ නම්, ඉන් පෙනී යන්නේ, අභියාචකයින් අභියාචන ඉදිරිපත් කරන අවස්ථාව වන විට ද ඔවුන්ට ද අදාළ සුදුසුකම් පැවතී නොමැති බවයි.
4. තවද, මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද මගේ සමාංක හා **2026.01.16** දිනැති ලිපියෙහි ඇතුළත් විධිවිධාන අනුව නව අයදුම්පත් කැඳවීමේ නිවේදනයක් සකස්කර එය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස මගේ අංක PSC/APP/19/8/24/**2025** හා **2026.04.02** දිනැති ලිපියෙන් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යංශ ලේකම් දැනුවත් කර ඇත.
5. එමෙන්ම අංක **2310/29** හා **2022.12.14** දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිහි VII පරිච්ඡේදයේ 68(III) රීතිය අනුව "කිසියම් හේතුවක් මත අයදුම්පත් කැඳවනු ලබන දිනය දීර්ඝ කරනු ලබන අවස්ථාවක දී" ප්‍රථම නිවේදනයේ සඳහන් අයදුම්කරුවන් විසින් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු දිනය වෙනස් නොකිරීමට කටයුතු කළ යුතුය" බවට සඳහන්ව ඇති බව ද කාරුණිකව දන්වා සිටිමි.

මේ අනුව පෙනී යන්නේ මේ අවස්ථාව වන විටද මෙම අධිකාරයේ මැදිහත්වීම මත අදාළ විභාගයට අයදුම් කිරීමට අවස්ථාව නොලැබූ එහෙත් වසර **13** ක සේවා කාලයක් සහිත අනිකුත් සුදුසුකම් සපුරා ඇති III ශ්‍රේණියේ නිලධාරීන් පිරිසකට එම අවස්ථාව සළසා දීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව පියවර ගෙන ඇති බවය. එසේම අභියාචකවරු විමසන පරිදි **2013** වසරේ කණ්ඩායම් **03** ක් සඳහා පත්වීම් අවස්ථා තුනකදී ලබාදී

ඇති බැවින් ඔවුන් සියළුම දෙනාගේ සුදුසුකම් සපුරන තුරු මෙම විභාගය නොපවත්වා සිටීම SOR අනුව සුදුසුකම් ලැබූ හා විශ්‍රාම යෑමට ආසන්නව උසස්වීම් අපේක්ෂාවෙන් සිටින පිරිසකට සිදු කරනු ලබන අසාධාරණයයි. එමෙන්ම රාජ්‍ය ප්‍රතිපත්තිය වන පුරප්පාඩු කඩිනමින් පිරවීමේ තීරණයට එය පටහැනිවේ. ඒ ක්‍රියාව දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු සඳහා බලපානු ලබයි. එසේම අභියාචකවරුන්ට **2024.05.11** දිනට පසුව ඇතිවන පුරප්පාඩු සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව පවතී.

මේ සියළුම කරුණු කෙරේ සළකා බලා මෙම අධිකාරය මැදිහත්වීම මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දැනටමත් අදාළ සුදුසුකම් සපුරා ඇති විභාගයට ඉල්ලීමට අවස්ථාව අහිමි වූ අයට සහනයක් ලබා දීමට පියවර ගෙන ඇති බැවින්, මෙම අභියාචනයන් තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යාමට අපේක්ෂා නොකරමු. අදාළ කටයුතු අවසන් කිරීමට තීරණය කරමු. මෙම තීරණය අදාළ පාර්ශව වලට සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වන්න.

අභියාචනය අවසන් කර ඇත.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-